**සමාගම් අරමුදල - 2015**
**------------------------------**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 479 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම.

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ලී බඩු, කාර්යාල උපකරණ හා පරිගණක වෙන්දේසි කිරීමෙන් ලැබුන රු.132,925 ක මුදල වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණද, අදාල වත්කම් හඳුනාගෙන ඒවායේ පිරිවැය හා ක්ෂය, ගිණුම් පොත් වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාලව 2015 වර්ෂයේ දී ලැබී තිබුණ රු.628,210 ක භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ පොලී මුදල 2015 වර්ෂයට අදාලව පොලිය ලෙස ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 131(1) සහ (2) වගන්ති ප්‍රකාරව, සෑම සමාගමක් විසින්ම ගෙවිය යුතු වාර්ෂික වාර්තා ආදායම් වලින් 2015 දෙසැම්බර් 31 දිනට සමාගම් අරමුදලට අයවිය යුතු මුළු හිඟ ආදායම රු.418,826,666 ක් වී තිබුණි. නමුත් එම මුදල් ප්‍රමාණය අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු හිඟ වාර්ෂික වාර්තා ආදායමක් ලෙස සටහන් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

---------------------------------

2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතුව පැවති රු.628,239,996 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237 ප්‍රකාරව ගිවිසුම පරිදි කොන්ත්‍රාත්තුව ඉටුකර ඇති බවට පිලිගත් තාක්ෂණික වෘත්තිකයෙකු විසින් ලබා දුන් සහතිකයක් මත ගෙවීම් කළ යුතු වුවද ලේඛනාගාරය වෙනුවෙන් මිලදී ගන්නා ලද CCTV කැමරා නිසි පරිදි සවිකර ක්‍රියාත්මක වන බවට සහතිකයක් ලබා ගැනීමෙන් තොරව රු. 5,346,000 ක් ගෙවීම් කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය.**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල.**

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 400,693,933 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.385,906,579 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.14,787,354 කින් එනම්, සියයට 3.8 කින් වර්ධනය වී තිබුණි. භාණ්ඩාගාර බිල්පත්/බැදුම්කර පොලී ආදායම රු.49,176,610 කින් අඩුවී තිබුණද අරමුදලේ අනෙකුත් ආදායම රු.57,035,471 කින් වැඩිවීම හා ආයතන හා පරිපාලන වියදම් රු.6,023,120 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ දී රු.269,443,580 ක්වූ අතිරික්තය ක්‍රමයෙන් වර්ධනය වී 2015 වර්ෂයේ දී රු.400,693,933 ක් විය. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සහ රජයට ගෙවූ බදු සැලකිල්ලට ගැනීමේ දී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ දී රු.276,571,736 ක්වූ අතර එය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී රු.412,575,129 ක් විය.

**4.** **මෙහෙයුම් සමාලෝචනය.**

**4.1** **කාර්යසාධනය.**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ මෙහෙවර වන්නේ රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇතිවන සේ අදාල පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබාදීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දැරීම වේ. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත, සමිති ආඥා පනත (123 වන අධිකාරිය), 1935 අංක 61 දරන සීට්ටු ආඥාපනත සහ 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යන ආඥාපනත් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සිදු කිරීමට සැලසුම්කර තිබූ කාර්යයන්ගේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම් පනතේ 170 (1) වගන්තියට අනුව මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 7076 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ සමාගම් සංඛ්‍යාව 2509 ක් වූයෙන් ලබාගෙන තිබූ මුළු ආදායම රු.2,509,000 ක් වූ අතර ඉන් සමාගම් අරමුදලට බැර කර තිබූ ප්‍රමාණය රු.1,672,666 ක් විය. නමුත්, සමාගම් පනත අනුව මූල්‍ය වාර්තා ලියාපදිංචි කල යුතු සමාගම් හඳුනාගෙන ඒවායේ මූල්‍ය වාර්තා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවීමට අදාල වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතු නොවීය.

(ආ) සමාගම් පනතට අනුකූලව සීමිත සමාගම් ලියාපදිංචි කිරීම සහ එමඟින් නියම කර ඇති විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම සහ ඒ අනුව ක්‍රියාකරන බවට වග බලා ගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී සමාගම් පනතෙන් නියම කර ඇති බලතල අනුව ක්‍රියාකර ලියාපදිංචි සමාගම්වල කටයුතු සමාගම් පනතේ නියම කර ඇති විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාමට කටයුතු කරවීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට සමාගම් පනතෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වුවත්, ලියාපදිංචි සමාගම්වල කටයුතු නියාමනය සඳහා වූ ක්‍රියාකාරී වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්.

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ලේඛනාගාරය.**

----------------

දෙපාර්තමේන්තුවේ ලේඛණාගාරයේ සමාගම් ලිපිගොනු 100,000 ක්, සමිති ලිපිගොනු 20,000 ක් හා වෙනත් ලිපිගොනු 30,000 ක් ගබඩා කර තිබෙන අතර දෛනිකව හුවමාරුවන ලිපිගොනු ප්‍රමාණය 800 සිට 1000 ක් සහ ඊට අතිරේකව දෛනිකව එකතුවන ලිපිගොනු ප්‍රමාණය 40 ත් 50 ත් අතර ප්‍රමාණයක් වී තිබුණි.

මේ සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ඉඩ පහසුකම් ලේඛනාගාරය තුළ නොතිබුණු අතර පිළිගත් ක්‍රමවේදයක් අනුව සුරක්ෂිතව ලේඛන ගබඩා කර නොතිබුණි. ලේඛනාගාරය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණු අතර පෞද්ගලික ආරක්ෂක සේවයේ නිලධාරීන් තිදෙනෙකු එහි රාජකාරී සඳහා අනුයුක්ත කර තිබුණි. ලේඛනාගාරයේ අනු පිටපත් (Backups) තබා ගැනීමේ ක්‍රම වේදයක්ද අනුගමනය කර නොතිබුණි.

**(ආ) සීමිත සමාගම් විසුරුවා හැරීම.**

---------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගොනු නොකරන සමාගම්වල නාමය කපා හැරීම සිදු කෙරෙන අතර එහිදී,

නාමය කපා හරින ලද සමාගම් සම්බන්ධයෙන් අයකර ගත නොහැකි හිඟ ආදායම මුළු හිඟ ආදායමෙන් අඩු කර නොතිබූ අතර ඇවර කිරීමේ කාර්යයන්ට අදාල කාර්යයන් සඳහා භාවිතා කළ යුතු විධිමත් ලේඛන භාවිතා නොකර තාවකාලික ලේඛන භාවිතා කර තිබුණි.

(ඇ) 2007 වර්ෂයේදී පොදු සමාගමක ආයෝජනය කර තිබූ රු.90,275,000 ක් වෙනුවෙන් මෙතෙක් කිසිදු ලාභාංශයක් සමාගම් අරමුදලට ලැබී නොතිබුණි. 2013 ජනවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මෙම සමාගම 2013 වර්ෂයේ සිට බුන්වත් වී තිබූ බව ප්‍රකාශකර තිබුණු අතර ඉහත ආයෝජිත මුදල සහ ඊට අදාල ප්‍රතිලාභ නැවත සමාගම් අරමුදලට ලබා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්.

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්යයන් පරිගණක ගත කිරීම සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පැරණි ලිපිගොනු ස්කෑන් කර ගොනු ගත කිරීම සඳහා රු.3,863,750 ක් සමාගම් අරමුදලින් ගෙවීම් කර තිබුණි. විශේෂයෙන් සකස් කරන ලද ගොනු (four holes files) 54,000 ක ප්‍රමාණයක්, ව්‍යාපෘතිය අතරමඟ නතරවීම නිසා අපේක්ෂා කළ අරමුණු ඉටු නොවීම නිසා සාමාන්‍ය ලිපිගොනු ලෙස භාවිතා කරයි.

(ආ) සේවකයින් පුහුණු කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා සමාගම් අරමුදලෙන් වෙන් කර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 90 ක් ඉතිරි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2015 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එමඟින් අරමුදල විසින් තම අරමුණු ඉටු කර ගැනීම සඳහා සිදු කරනු ලබන එක් එක් කාර්යයන්ගේ ස්වභාවය සහ ඒවා සඳහා වගකිව යුතු නිලධාරීන්, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගත වන කාලසීමාවන් පැහැදිලිව දක්වා නොතිබුණි. 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අයවැය තොරතුරු ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැයගත හා තථ්‍ය ආදායම වියදම අතර සියයට 20 සිට සියයට 137 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් සකස් කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය පරිදි වසර තුනක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර නොතිබුණු අතර එය සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 ඡේදය අනුව ඇප සුරක්ෂණ ලබා ගැනීමෙන් තොරව පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතිය ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීම නිසා අසාර්ථක වූ කොන්ත්‍රාත්කරුගෙන් රු.13,268,430 ක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම, 2015 ජුලි 21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මෙම ව්‍යාපෘතියේ මෘදුකාංග සම්පාදනය සහ උපදේශක සේවා ලබා ගැනීමට නැවත මිල ගණන් කැඳවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද 2016 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (1) වගන්තියට අනුව හැකිතාක් අවම කාලසීමාවක් ඇතුළත ලංසු ඇගයීම් කළ යුතු වුවත්, රු.261,960 ක් වැය කරමින් මුදල් ගණක යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම, රු.58,600 ක් වටිනා තිත් න්‍යාය මෘදුකය (DOT Matrix) ප්‍රින්ටරයක් මිලදී ගැනීම හා රු.687,232 ක් වටිනා UPS 10 ක් මිලට ගැනීමේදී සැලකිය යුතු කාලයක් ප්‍රමාද කර ලංසු ඇගයීම් සිදු කර තිබීම විගණනයේදී විශේෂයෙන් නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් නොකිරීම. |
| | (ii) වත්කම් ඉවත් කිරීමේදී නිවැරදිව සටහන් කිරීම හා ගිණුම් ගත නොකිරීම. |
| | (iii) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ගිණුම්වලට පිටපත් කිරීමේදී සහ වර්ෂ අවසාන වියදම් උපචිත වියදම් වලට ගැනීමේදී අදාල ජර්නල් සටහන් උපයෝගී කර ගැනීමෙන් තොරව සිදුකර තිබිණි. |
| (ආ) ආදායම් අයකර ගැනීම | (i) 2008 ජනවාරි සිට 2015 වසර දක්වා පවතින හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් ආයතනය තුළ ස්ථාපනය කර නොතිබීම. |
| | (ii) සත්‍ය වශයෙන්ම ක්‍රියාකාරී සමාගම් සංඛ්‍යාව ක්‍රියාකාරී නොවන සමාගම් සංඛ්‍යාව සහ ක්‍රියාකාරී නොවන සමිති සංඛ්‍යාව පිළිබඳ නිවැරදි සාධන දත්ත ලබාගැනීම සඳහා විධිමත් පරිගණක පද්ධතියක් නොතිබීම නිසා අරමුදලේ රැස්කර ගත හැකි ආදායම පිලිබඳව නිවැරදිව හඳුනාගත නොහැකි වීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 56 ක් පවතින අතර මෙය අරමුදලෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබීම. |